**RETIREMENT**

AIA EASY PENSIONS



# ටක් ටික් ටුක් තරම්ම ලේසියි

HEALTHIER, LONGER, BETTER LIVES

aialife.com.lk

අප සෑම දෙනෙකුටම පාහේ විශ්‍රාම දිවියට මුහුණදීමට සිදුවන අතර, බොහෝ දෙනා අතින් වයස්ගත වන තුරුම ඒ පිළිබඳව සිතීම අතපසු වේ. සැබෑ තත්ත්වය වන්නේ විශ්‍රාමය සඳහා සැලසුම් සකස් කිරීම කල්තබා සිදුකළ තරමට එය යෝග්‍ය වන බවයි.

ඔබ විසින් සිහින මැවූ විදෙස් සංචාර හෝ විශ්‍රාම ගැනීමෙන් අනතුරුව මාසික ආදායමක් හිමිකර ගැනීම, ඔබට සුපුරුදු ජීවන රටාව පවත්වාගෙන යාම වැනි දේ සඳහා ඉතිරි කිරීමට මේ හොඳම කාලයයි. මාසිකව සුළු මුදලක් ඉතිරි කරමින් ඔබ විසින් කල්තබා ඉතුරුම් සිදුකිරීම අරඹන තරමටම, ඔබගේ විශ්‍රාම දිවිය වඩාත් සුරක්ෂිත වනු ඇත.

AIA Easy Pensions සමගින් සරල පියවර 3ක් ඔස්සේ ඔබගේ විශ්‍රාමය සැලසුම් කළ හැකියි. ඇත්තෙන්ම එය ටක් ටික් ටුක් තරමටම ලේසියි.

## මෙමගින් මා හට හිමිවන්නේ කුමක්ද?

**කල්පිරීමේදී එකවර මුළු මුදලක් හෝ මාසික ආදායමක්: තේරීම ඔබ සතුයි**

එකවර මුළු මුදලක් වශයෙන් ඔබේ රක්ෂණාවරය කල්පිරීමේ ප්‍රතිලාභය ලබාගැනීමට ඔබට හැකි වේ. නැතිනම් වසර 10 - 30 කාල සීමාවක් සඳහා මාසික ආදායමක් වශයෙන් එය ලබාගැනීමේ අවස්ථාව ඔබ සතු වේ.

**ඔබගේ ඉතුරුම් සඳහා ආකර්ෂණීය වර්ධනයක් - අපගේ ලෝයල්ටි ප්‍රසාද තිළිණ**

ඔබ විසින් නිසි කලට වාරික ගෙවීම සිදුකරනු ලබන්නේනම් 10 වැනි වසර අවසානයේදී ඔබේ මූලික වාර්ෂික වාරිකය මෙන් 400% ක් දක්වා වන ලෝයල්ටි ප්‍රසාද තිළිණ ඔබ වෙත හිමි වේ. (ඔබ විසින් තෝරාගනු ලබන වාරික මාදිලිය අනුව)

**ඔබේ පවුල වෙත ජීවිත රක්ෂණ ප්‍රතිලාභයක්**

කිසියම් අවාසනාවන්ත ආකාරයකින් ඔබ වියෝ වුවහොත්, ඔබෙන් යැපෙන්නන් වෙත අසීරුතාවලින් තොර දිවි පෙවෙතක් සඳහා ජීවිත රක්ෂණ ප්‍රතිලාභය හිමි වේ.

**ඔබ සහ ඔබේ පවුල සඳහා හදිසි අනතුරු ප්‍රතිලාභයක්**

හදිසි අනතුරකින් ඔබ වියෝ වුවහොත් හෝ පූර්ණ/අර්ධ අකර්මණ්‍යතාවයකට පත් වුවහොත් හදිසි අනතුරු ප්‍රතිලාභය මගින් ඔබ සහ ඔබේ පවුල වෙත රැකවරණය සැලසේ. ඔබ විසින් වාරික ගෙවීම සඳහා වාර්ෂික මාදිලිය තෝරාගනු ලබන්නේනම් හදිසි අනතුරු ප්‍රතිලාභ වාරිකයෙන් 30% ක වට්ටමක් ඔබ වෙත හිමි වේ.

**ඔබට තවදුරටත් වාරික ගෙවීමේ හැකියාවක් නොමැති වුවහොත් AIA මගින් ඔබේ පෙන්ෂන්ස් අරමුදල ගොඩනංවනු ලැබේ.**

වාරික ගෙවීමේ කාලසීමාව තුළ ඔබ වියෝ වුවහොත් හෝ පූර්ණ හා සදාකාලික අකර්මණ්‍යතාවයකට පත් වුවහොත් AIA වාරිකාවරණ ප්‍රතිලාභය මගින් ඔබ වෙනුවෙන් ඔබේ වාරික ගෙවමින් ඔබේ රක්ෂණාවරය අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. එම නිසා ඔබ විසින් ඔවුන් සඳහා ගොඩනංවන ලද පෙන්ෂන්ස් අරමුදලෙහි ප්‍රතිලාභ අත්විඳීමේ අවස්ථාව ඔබේ පවුල වෙත හිමි වේ.

**හදිසි අවස්ථාවකදී මුදල් ආපසු ගැනීමේ හැකියාව**

ඔබේ රක්ෂණාවර කාලසීමාව ඇතුළත එක්වරක් පමණක් ඔබේ අරමුදලෙන් 15% ක් දක්වා මුදලක් ආපසු ලබාගැනීමේ අවස්ථාව ඔබ සතු වේ.

## අලුත්! (අමතර ප්‍රතිලාභ)

**රෝහල් ගතවීමේ ප්‍රතිලාභය**
ඔබ දින තුනකට වඩා රෝහල් ගතව සිටියේනම්, සෑම දිනකටම (ඇතුළත් කළ දිනයේ සිට) රු. 4,000 ක උපරිමයක් දක්වා මුදල් ලබා දෙයි.

**බරපතල රෝග ප්‍රතිලාභය**
පිළිකා, හෘදයාබාධ, ආඝාත, වකුගඩු ආබාධ වැනි බරපතල රෝග 22ක් සඳහා මූල්‍යමය රැකවරණයක් ඔබට ලබා දීම සඳහා රු 400,000 දක්වා ප්‍රතිලාභයක්.

## ඔබගේ විශ්‍රාමය පහසු පියවර තුනකින්

සරල පියවර 3ක් ඔස්සේ ඔබට මෙම සැලසුම ලබාගත හැකි වේ.

**1 පියවර: ඔබ අපේක්ෂා කරන රැකවරණයෙහි ප්‍රමාණය තෝරාගන්න**
AIA Easy Pensions මගින් පෙන්ෂන් පැකේජ 4 ක් ඉදිරිපත් කෙරේ. ඔබ විසින් තෝරාගනු ලබන පැකේජය ජීවිත හා හදිසි අනතුරු රක්ෂණාවරණයකින් සමන්විත වන අතර එමගින් ඔබේ පවුලේ මූල්‍යමය සුරක්ෂිතතාවය පිළිබඳ ඔබට සිතේ නිදහස උරුම කෙරේ.

| | මරණයකදී ජීවිත රක්ෂණ ප්‍රතිලාභය (අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි.) | හදිසි අනතුරක් හේතුවෙන් මරණය සිදුවීනම් (අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි.) | හදිසි අනතුරක් හේතුවෙන් අකර්මණ්‍යතාවයකට පත් වී නම් (අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි.) |
|---|---|---|---|
| 1 පැකේජය | 360,000 | 900,000 | 540,000 (දක්වා) |
| 2 පැකේජය | 480,000 | 1,200,000 | 720,000 (දක්වා) |
| 3 පැකේජය | 600,000 | 1,500,000 | 900,000 (දක්වා) |
| 4 පැකේජය | 720,000 | 1,800,000 | 1,080,000 (දක්වා) |

**2 පියවර: ඔබට කොපමණ කාලයක් සඳහා ඉතිරි කිරීමට අවශ්‍යදැයි තෝරාගන්න. (ඔබේ රක්ෂණවර කාලසීමාව)**
වසර 15, 20, 25 හෝ 30 යන රක්ෂණවර කාලසීමාවන්ගෙන් එකක් තෝරාගන්න. ඔබගේ අරමුදල වර්ධනය වන සහ ඔබ සහ ඔබේ පවුල වෙත රැකවරණය සැලසෙන කාලසීමාව මෙය වේ.

**3 පියවර: විශ්‍රාම ගැනීමේදී එකවර මුළු මුදලක් හෝ මාසික ආදායමක් තෝරාගන්න.**
එකවර මුළු මුදලක් වශයෙන් ඔබේ සම්පූර්ණ කල්පිරීමේ ප්‍රතිලාභය ලබාගැනීමට ඔබට හැකි වේ. නැතිනම් වසර 10 - 30 කාලසීමාවක් සඳහා මාසික ආදායමක් වශයෙන් එය ලබාගැනීමේ අවස්ථාව ඔබ සතු වේ.

## ඔබගේ ඉතුරුම් වර්ධනය වන ආකාරය

ඔබගේ ඉතුරුම් වෘත්තීය අරමුදල් කළමනාකරුවන් විසින් විචක්ෂණශීලීව කළමනාකරණය කෙරෙන අතර වසරින් වසර ඔබගේ ඉතුරුම්වල වර්ධනය පිළිබඳව තහවුරු කෙරෙනු ඇත. උදාහරණයක් වශයෙන්, ඔබ 2017 දී 35 හැවිරිදි වේනම් සහ වයස අවුරුදු 55 දී විශ්‍රාම ගැනීමට අපේක්ෂා කරන්නේනම් (වසර 20 ක රක්ෂණවර කාලසීමාවක්) සහ 3 පැකේජය තෝරාගන්නේනම්, ඔබගේ වාර්ෂික වාරිකය රු. 40,647 ක් වේ. වයස අවුරුදු 55 දී ඔබගේ නිදර්ශිත විශ්‍රාම ඉතුරුම් අරමුදල පහත දැක්වෙන පරිදි වේ:

| අරමුදල් විස්තර | උපකල්පිත ලාභාංශ අනුපාත (අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි.) | | |
|---|---|---|---|
| | වසරකට 4% | වසරකට 8% | වසරකට 12% |
| කල්පිරීමේදී එකවර හිමිවන මුදල | 907,832 | 1,396,900 | 2,182,261 |

ඔබ විසින් වසර 15ක් සඳහා මාසික ආදායමක් ලබාගැනීම තෝරාගනු ලැබුවේ නම් නිදර්ශිත මාසික ආදායම පහත දැක්වෙන පරිදි වේ:

| නිදර්ශිත මාසික ආදායම | උපකල්පිත ලාභාංශ අනුපාත (අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි.) | | |
|---|---|---|---|
| | වසරකට 4% | වසරකට 8% | වසරකට 12% |
| කල්පිරීමේ වයසේදී | 5,044 | 7,761 | 12,124 |
| 5 වැනි වසර ආරම්භයේදී | 5,732 | 10,268 | 18,571 |
| 10 වැනි වසර ආරම්භයේදී | 6,726 | 14,570 | 31,647 |
| 15 වැනි වසර ආරම්භයේදී | 7,892 | 20,675 | 53,930 |
| **සමස්ත පෙන්ෂන් වටිනාකම** | **1,146,500** | **2,385,744** | **5,106,561** |

ඉහත වගුවල දැක්වෙන ප්‍රක්ෂේපිත අගයයන් ගණනය කරනු ලැබ ඇත්තේ 4%, 8% සහ 12% උපකල්පිත ලාභාංශ අනුපාතයන් යොදාගනිමින් සහ අදාළ ගාස්තු භාවිත කොට සහ සියලුම වාරික නියමිත දිනයන්හිදී ගෙවනු ලැබ ඇති බවට උපකල්පනය කරමිනි. ඔබ විසින් තෝරාගනු ලබන වාරික ගෙවීමේ මාදිලිය අනුව නිදර්ශිත අගයයන් වෙනස් වේ. උදා: අර්ධ වාර්ෂික, ත්‍රෛමාසික, මාසික වශයෙන්. මෙම උපකල්පිත ලාභාංශ අනුපාතයන් සහතික කරනු නොලබන අතර එමගින් ඔබ වෙත හිමි විය හැකි උපරිම හෝ අවම සීමාවන් නිරූපනය නොකෙරේ.

ඉහත නිදර්ශිත විශ්‍රාම ප්‍රතිලාභයට අමතරව, ඔබගේ රැකවරණ ප්‍රතිලාභ පහත දැක්වෙන පරිදි වේ:

| අන්තර්ගත ප්‍රතිලාභ | මුදල (අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි.) |
|---|---|
| මරණය සිදුවුවහොත් ගෙවනු ලබන මුදල (මූලික වාර්ෂික වාරිකය + අමතර ජීවිත රක්ෂණ ප්‍රතිලාභය) | 600,000 |
| හදිසි අනතුරක් හේතුවෙන් මරණය සිදුවුවහොත් ගෙවනු ලබන මුදල | 1,500,000 |
| වාරික ආරක්ෂණ ප්‍රතිලාභය | මරණය හෝ පූර්ණ සදාකාලික අකර්මණ්‍යතා අවස්ථාවකදී වාරික ගෙවීමේ අවශ්‍යතාවය නොසළකා හැරේ. කෙසේවුවද රක්ෂණාවරය මගින් රක්ෂණාවර කාලසීමාව පුරා අඛණ්ඩව ප්‍රතිලාභ සැලසෙනු ඇත. |

මූලික ජීවිතාවරණ ප්‍රතිලාභය සැලසීම සහ ඔබේ ඉතුරුම් අරමුදල ගොඩනැංවීම සඳහා රු.30,000 ක් වන මූලික වාර්ෂික වාරිකය යොදා ගැනේ. සමස්ත වාර්ෂික වාරිකය වන රු.40,467 සඳහා “අමතර ජීවිත රක්ෂණ ප්‍රතිලාභය”, “වාරික ආරක්ෂණ ප්‍රතිලාභය” සහ “හදිසි අනතුරු ප්‍රතිලාභය” සඳහා වන වාරික ද ඇතුළත් වේ.

## වෙනත් සැලසුම් විස්තර

ඇතුළත්වීමේ වයස: අවුරුදු 19 - 61 (ඊළඟ උපන් දිනට)
උපරිම කල්පිරීමේ වයස: අවුරුදු 76 (ඊළඟ උපන් දිනට)

### රක්ෂණාවර කාලසීමාව

රක්ෂණාවර කාලසීමාව වසර 15, 20, 25 හෝ 30

### වාරික ගෙවීමේ කාලසීමාව

රක්ෂණාවර කාලසීමාව පරිදිම වේ.

## ටොප්-අප් (Top-up)
අවම ටොප්-අප් (Top-up): රු. 5,000

## ලෝයල්ටි ප්‍රසාද තිළිණ
ඔබේ ලෝයල්ටි ප්‍රසාද තිළිණ ඔබ තෝරාගන්නා වාරික ගෙවීමේ ක්‍රමය මත රඳා පවතී.

| මාසික | ත්‍රෛමාසික | අර්ධ වාර්ෂික | වාර්ෂික |
|---|---|---|---|
| 280% | 295% | 320% | 400% |

## අදාළ ගාස්තු
වාරිකය මත වෙන් කිරීමේ ගාස්තුව (රක්ෂණාවර අරමුදල් වෙත වෙන් කිරීමට පෙරාතුව මූලික වාරිකයෙන් අඩු කරගැනේ.)

| රක්ෂණාවර වසර | 1 වසර | 2 වසර | 3 වසර සිට |
|---|---|---|---|
| මූලික වාරිකය මත වෙන් කිරීමේ ගාස්තුව | 80% | 35% | 0% |
| අමතර වාරිකය මත වෙන් කිරීමේ ගාස්තුව | එක් එක් අමතර වාරිකය මත 4% | | |

### පවාරණ ගාස්තු

| රක්ෂණාවර වසර | 1 වැනි | 2 වැනි | 3 වැනි | 4 වැනි වසර සිට |
|---|---|---|---|---|
| පවාරණ ගාස්තු | 100% | | | 4 වැනි වසර සිට පවාරණ ගාස්තු රක්ෂණාවර කාල සීමාව පුරා 100% සිට 0% දක්වා රේඛීය වශයෙන් පහත වැටේ. |

**පරිපාලන ගාස්තුව:**
2018 සඳහා වසරකට රු.287.50 ක් වන අතර එක් එක් වසරෙහි ජනවාරි 1 වැනි දින වසරකට 15% බැගින් ඉහළ යයි.

**අරමුදල් කළමනාකරණ ගාස්තුව:**
වසරකට ආයෝජන ගිණුමෙහි ශේෂයෙන් 0.75%

**මෘත්‍යතා ගාස්තුව:**
මූලික ජීවිත රක්ෂණ ප්‍රතිලාභය සහ සමාගමෙහි ගාස්තු ආවරණ පිරිවැය මිල ගණන් මත පදනම් වේ.

**වාරික මාදිලි ගාස්තුව:**
මාසික වාරික මාදිලිය සඳහා පමණක් 4% (මූලික වාරිකය සඳහා පමණක් අදාළ වේ.)

**නීතිරීති හා කොන්දේසි:**
ජීවිත රක්ෂිතයා රක්ෂණාවරහිමියා නොවන්නේනම් මෙම රක්ෂණාවරය මගින් සපයනු ලබන ප්‍රතිලාභ රක්ෂණාවරහිමියා වෙත අදාළ වන අතර, ආවරණයන් ජීවිත රක්ෂිතයා වෙත අදාළ වේ.

මෙම සැලසුම ලබාගත හැකි වන්නේ බලපත්‍රලත් AIA වෙල්ත් ප්ලෑනර්වරයකුගෙන් හෝ මූල්‍ය සැලසුම් නිලධාරියකුගෙන් පමණි.

මෙය සැලසුම පිළිබඳ දළ විස්තරයක් පමණි. සම්පූර්ණ සැලසුම් විස්තර සහ නීතිරීති හා කොන්දේසි සඳහා කරුණාකර රක්ෂණාවර ඔප්පුව බලන්න.

EP - 300000334
V3 - 05/18

# AIA සමූහය පිළිබඳ

AIA සමූහය ආසියා ශාන්තිකර කලාපයෙහි විශිෂ්ටතම ජීවිත රක්‍ෂණ සේවා සම්පාදකයා වේ.



1919
චීනය

1931
හොංකොං

1931
සිංගප්පූරුව

1938
තායිලන්තය

1947
පිලිපීනය

1948
මැලේසියාව

1957
බෲනායි

1972
ඕස්ට්‍රේලියාව

1981
නවසීලන්තය

1982
මැකාවු

1984
ඉන්දුනීසියාව

1987
කොරියාව

1990
තායිවානය

2000
වියට්නාමය

2001
ඉන්දියාව

2012
ශ්‍රී ලංකාව

2013
මියන්මාරය *

2015
කාම්බෝජය

*මියන්මාරයේ ඇත්තේ AIA නියෝජිත කාර්යාලයකි.

**US$ ට්‍රිලියන 1 කට** වැඩි සමස්ත මූලික රක්ෂිත මුදලක්

ආසියාවේ **වසර 100 කට ආසන්න** සාඩම්බර ඉතිහාසයක්

**වෙළඳපළ 18 ක මෙහෙයුම්**

**මිලියන 30 කට** අධික තනි පුද්ගල රක්ෂණවර

**මිලියන 16 කට** අධික සමූහ සැලසුම් සාමාජිකයින්

AIA Insurance Lanka PLC (Co.No.PQ 18) විසින් නිකුත් කරන ලදී. 05/2018

HEALTHIER, LONGER, BETTER LIVES

**AIA ඉන්ෂුවරන්ස් ලංකා PLC**
(Co.No.PQ 18)
AIA ටවර්, 92, ධර්මපාල මාවත, කොළඹ 07
ක්ෂණික ඇමතුම්: 011 2310310
ෆැක්ස්: 011 4715892
ඊ-මේල්: lk.info@aia.com